**ජාතික ඖෂධ නියාමන අධිකාරිය - 2022**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 අහිතකර මතය

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් අහිතකර මතයක් නිකුත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 237 (ආ) ප්‍රකාරව භාණ්ඩ ලැබී ඇති බවටද අදාළ බඩු ලේඛන හෝ තොග පොත්වල ඇතුළත් කර ඇති බවට සහතිකයක් ලබා නොගෙන සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 07 කදී රු.1,801,296 ක ගෙවීම් වවුචර් සහතික කර තිබුණු බව නියැදි විගණන පරීක්ෂාවකදී අනාවරණය විය. | මේ වන විට විධිමත් ආකෘති පත්‍රයක් (GRN) හරහා භාණ්ඩ ලැබී ඇති බවට හා තොග ලේඛනවල ඇතුලත් කර ඇති බවට ගබඩා භාරකරුගෙන් සහතික කරවා ගත් පසු ගෙවීම් සිදු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) මුදල් රෙගුලාසි 257 ප්‍රකාරව සහතික කළ වවුවර සඳහා පමණක් ගෙවීම් කළ යුතු අතර වවුවර සහතික කිරීමේ අධිකාරය ලත් නිලධාරියෙකු විසින් නිසි පරිදි සහතික කොට ඇති බවට වගබලා ගැනීම වවුවර අනුමත කරන හෝ මුදල් ගෙවන සෑම නිලධාරියෙකුම සතු කාර්යයක් වුවද, නියැදි පරීක්ෂාවට අනුව අවස්ථා 15 කදී රු.28,873,570 ක සහතික නොකළ වවුවර සඳහා ගෙවීම් කර තිබුණි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවන ලෙස කටයුතු කරන බව. | එම |
| (ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව මුළු පිරිවැය රු.191,539,373 ක් වූ දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | ඉදිරියේදී විධිමත්ව වත්කම් ලේඛනය පවත්වා ගැනීම සම්බන්ධයෙන් විෂයභාර නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 හි 38 සහ 38A ඡේද ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා ඇති සියළුම අගයන් සඳහා පෙර වර්ෂයේ සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කළ යුතු වුවද, අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා පෙර වර්ෂයේ සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. තවද, සංසන්දනාත්මක මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුලනය නොවී පැවතුණු අතර රු.56,000,000 ක වෙනසක් නිරූපනය විය. | 2022 වර්ෂයේදී ගිණුම් සකස් කිරීමේදී සිදුව ඇති අතපසුවීමක් වන අතර ඉදිරි වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේදී පෙර වර්ෂයේ සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරන අතර සංසන්දනාත්මක මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුලනය නොවීම අතපසුවීමක් බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 හි 54 හා 57 ඡේද ප්‍රකාරව ස්කන්ධය යටතේ දැක්විය යුතු රු.5,920,019 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන ශේෂය ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ අධිකාරියේ මුළු හිමිකම සහ ජංගම නොවන වගකීම් ශේෂයන් ඊට සමාන අගයකින් පිළිවෙළින් අඩුවෙන් සහ වැඩියෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය නව ආකෘතියකට සකස් කිරීම හේතුවෙන් මෙම අඩුපාඩු සිදු වී ඇති අතර ඉදිරි වර්ෂයේ අවසන් ගිණුම් තුළින් අදාල නිවැරදි කිරීම් සිදු කරන බව. | එම |
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 හි 106(d)(iii) ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ රු.645,817,300 ක භාණ්ඩාගාර බද්ද, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය තුළ ඇතුළත් කිරීම වෙනුවට විස්තීරණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ආදායම ඊට සමාන අගයකින් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය නව ආකෘතියකට සකස් කිරීම හේතුවෙන් මෙම අඩුපාඩු සිදු වී ඇති අතර ඉදිරි වර්ෂයේ අවසන් ගිණුම් තුළින් අදාල නිවැරදි කිරීම් සිදු කරන බව. | එම |
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 හි 106 හා 108 ඡේද ප්‍රකාරව ස්කන්ධයේ සංරචක පමණක් ඇතුලත් වන පරිදි ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය පිළියෙළ කළ යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ | එම | එම |

| | | |
|---|---|---|
| ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය තුළ පිළිවෙළින් රු.4,697,073 ක් සහ රු.2,638,603 ක් වූ පශ්චාත් සේවක ප්‍රතිලාභ සහ විලම්භිත බදු වගකීම් ශේෂයන් ඇතුළත් කර තිබුණි. එම හේතුවෙන් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය තුළ සමාලෝචිත වර්ෂය අවසානයට වූ මුළු හිමිකම රු.7,335,676 කින් වැඩියෙන් දක්වා තිබුණි. | | |
| (ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 හි 112 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සැකසීමේ පදනම සහ නිශ්චිත ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳ තොරතුරු සටහන් මගින් ඉදිරිපත් කළ යුතුය. එහෙත් පිරියත හා උපකරණවල පිරිවැයෙන් හානිකරණ පාඩු අඩු කර ඇති බව, වාර්තාකරන දිනට පිරියත හා උපකරණවල ක්ෂය ක්‍රමය, ඵලදායී ජීව කාලය හා සුන්බුන් අගය නැවත තක්සේරු කර ඇති බව, මුදල් හා මුදල් සමාන දෑ තුළ ඇමතුම් තැන්පතු ඇතුළත් බව, බැංකු අයිරා අධිකාරියේ මුදල් කළමනාකරණයේ අත්‍යාවශ්‍ය අංගයක් බව, අධිකාරියේ ආදායම් බදු 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත ප්‍රකාරව ගණනය කරන බව සහ ගෙවන ලද භාණ්ඩාගාර බදු මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වන මුදල් ප්‍රවාහ යටතේ වර්ග කර ඇති බව වැනි සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ නොසැසඳෙන සාවද්‍ය ප්‍රකාශයන් සටහන් තුළ ඇතුළත්ව තිබුණි. | මෙම ඉදිරිපත් කර ඇති සටහන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කර ඉදිරි වර්ෂයේ අවසන් ගිණුම් තුළ විධිමත්ව සටහන් ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කරන බව. | එම |
| (ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07 හි 07 ඡේදය ප්‍රකාරව ආයෝජිත දින සිට මාස 03 ක් හෝ ඊට අඩු කාලයක් තුළ කල් පිරෙන ආයෝජන පමණක් මුදල් සමාන දෑ වශයෙන් සැලකිය යුතු වුවද, අධිකාරිය විසින් ඊට වැඩි කල්පිරීම් කාලයන් සහිත එකතුව රු.2,414,857,497 ක් වූ භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන 05 ක් මුදල් සමාන දෑ යටතේ දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ අවසන් ගිණුම් තුළින් අදාල නිවැරදි කිරීම් සිදු කරන බව. | එම |

| | | |
|---|---|---|
| (උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07 හි 18(b) සහ 20 ඡේද ප්‍රකාරව මූදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ නොකිරීම හේතුවෙන් කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් ලාභය රු.643,640,666 ක් අඩුවෙන්ද, කාරක ප්‍රාග්ධන අයිතමවල වෙනස සහ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය පිළිවෙළින් රු.245,817,300 ක් සහ රු.397,823,366 ක් වැඩියෙන් දක්වා තිබුණු අතර ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය රු.397,823,366 ක් අඩුවෙන් දක්වා තිබුණි. | එම | එම |
| (ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 හි 42(a) ඡේදය ප්‍රකාරව සංසන්දනාත්මක අගයන් නැවත දැක්වීම මඟින් (Restate) නිවැරදි කළ යුතු රු.1,781,077 ක පූර්ව වර්ෂවල වැරදි සහ 42(b) ඡේදය ප්‍රකාරව වත්කම්, වගකීම් සහ හිමිකම් ගිණුම්වල ආරම්භක ශේෂයන් නැවත දැක්වීම මඟින් නිවැරදි කළ යුතු රු.1,154,844 ක පූර්ව වර්ෂවල වැරදි සෘජුවම සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදලට ගලපා තිබුණි. | එම | එම |
| (එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 හි 49(a) සහ 49(b) ඡේද ප්‍රකාරව නිවැරදි කරන ලද පූර්ව වර්ෂවල වැරදිවල ස්වභාවය සහ අදාළ රේඛීය අයිතමවල නිවැරදි කරන ලද වටිනාකම් හෙළිදරව් කළ යුතු වුවත් අධිකාරිය විසින් සමුච්චිත අරමුදලට බැර කරන ලද එකතුව රු.209,335,287 ක් වූ පූර්ව වර්ෂවල ගැලපිලි සම්බන්ධයෙන් ඉහත පරිදි කටයුතු කර නොතිබුණි. එම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ දක්වා තිබුණු රු.4,498,490,257 ක් වූ සමුච්චිත අරමුදල් ශේෂයෙහි නිරවද්‍යතාවය ප්‍රමාණවත් පරිදි තහවුරු නොවුණි. | එම | එම |

| | | |
|---|---|---|
| (ඒ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 10 හි 9(c) ඡේදය ප්‍රකාරව වාර්තාකරණ කාලය අවසන් වීමට පෙර අත්පත් කර ගත් වත්කම්වල පිරිවැය වාර්තාකරණ කාලයෙන් පසුව තීරණය කිරීමේ දී මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපිය යුතු වුවත් 2023 පෙබරවාරි 06 දින රු.17,750,000 කට තක්සේරු කරන ලද එවැනි වාහන 03 ක පිරිවැය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ නොගැලපීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම් ශේෂය ඊට සමාන අගයකින් අඩුවෙන් දක්වා තිබුණි. | අධිකාරිය වෙත භාරදුන් වාහන 3හි වටිනාකම රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2023.02.06 දින තක්සේරු කර ලබා දී ඇති අතර එය ඉදිරි වර්ෂයේ අවසන් ගිණුම් තුළ ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කරන බව. | එම |
| (ඔ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12 හි 80(b) ඡේදය ප්‍රකාරව පූර්ව වර්ෂවල ආදායම් බදු සඳහා සමාලෝචිත වර්ෂය තුළ හඳුනාගන්නා සියළුම ගැලපීම් සමාලෝචිත වර්ෂයේ ආදායම් බදු වියදමට ගැලපිය යුතුය. එහෙත් පසුගිය වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දුන් රු.124,779,724 ක ආදායම් බදු අධිතක්සේරු වීම නිවැරදි කිරීම සඳහා රු.201,933,336 ක වැරදි වටිනාකමක් සමුච්චිත අරමුදලට බැර කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම් බදු වියදම රු.124,779,724 කින් අධිතක්සේරු වී තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල රු.77,153,612 ක් වැඩියෙන් දක්වා තිබුණි. | අධිකාරියේ 2016 වර්ෂයේ සිට ආදායම් බදු නැවත ගණනය කර 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීම් කළ අතර එම ගණනය කිරීම් වලදී මෙලෙස ආදායම් බදු වියදම අධිතක්සේරු වී ඇති අතර ඒ සම්බන්ධයෙන් අදාල නිවැරදි කිරීම් ඉදිරි වර්ෂයේ අවසන් ගිණුම් තුළින් සිදු කරන බව. | එම |
| (ඕ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 61 ඡේදය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණවල ඵලදායි ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය කර, අපේක්ෂා කරන තත්ත්වයන් ඇස්තමේන්තු වලින් වෙනස් වන්නේ නම් එම වෙනස්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කළ යුතු වුවත් එපරිදි කටයුතු නොකිරීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට පොත් අගය ශූන්‍ය වූ පිරිවැය රු.33,242,530 ක් වූ වත්කම් අයිතම 297 ක් තව දුරටත් භාවිතා කරමින් පැවතුණු අතර මෙම ප්‍රමිතියේ 76 ඡේදය ප්‍රකාරව ඒ පිළිබඳව හෙළිදරව් කිරීමට ද කටයුතු කර නොතිබුණි. | මෙම වත්කම් අයිතම 297 සම්බන්ධයෙන් අදාල හෙළිදරව් කිරීම් ඉදිරි වර්ෂයේ අවසන් ගිණුම් තුළින් සිදු කරන බව. | එම |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට සහ අවසාන දිනට ගෙවිය යුතු නිවැරදි ආදායම් බදු වටිනාකම් පිළිවෙළින් රු.27,056,509 ක් සහ රු.178,969,934 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශන තුළ පිළිවෙළින් රු.151,836,233 ක් සහ රු.10,982,871 ක් ලෙස වරදවා දක්වා තිබීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු නිවැරදි ආදායම් බදු වගකීම රු.167,986,963 ක් අඩුවෙන් දක්වා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ බදුවන ආදායම ගණනය කිරීමේ දී භාණ්ඩාගාර බදු රු.645,817,300 ක්, වෙනත් බදු රු.475,999 ක්, පශ්චාත් සේවක ප්‍රතිලාභ වෙන්කිරීම් රු.1,862,372 ක් සහ නෛතික වියදම් රු.653,975 ක් වශයෙන් එකතුව රු.648,809,646 ක සුදුසුකම් නොලබන ගෙවීම් අඩු කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම් බද්ද රු.90,833,350 කින් අවතක්සේරු වී තිබුණි. | අධිකාරියේ 2016 වර්ෂයේ සිට ආදායම් බදු නැවත ගණනය කර 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීම් කළ අතර එම ගණනය කිරීම් වලදී මෙලෙස ආදායම් බදු වියදම අධිතක්සේරු වී ඇති බව සහ ඒ සම්බන්ධයෙන් අදාල නිවැරදි කිරීම් ඉදිරි වර්ෂයේ අවසන් ගිණුම් තුළින් සිදු කරන බව. | වර්ෂයේ ආදායම් බදු වියදම සහ වර්ෂ අවසානයට ආදායම් බදු වගකීම නිවැරදිව ගණනය කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ රු.113,764,932 ක ස්ථාවර තැන්පතු පොළී ආදායම ගණනය කර ගිණුම්ගත නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ආදායම සහ 2022 දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් ශේෂය ඊට සමාන අගයකින් අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම් පවත්වාගෙන යනු ලබන බැංකුව මගින් ලබා දුන් ගිණුම් ප්‍රකාශය තුළ ස්ථාවර තැන්පතු පොලී ආදායම දක්වා නොමැති වුවද ඉදිරි වර්ෂයේ දී ඒ සඳහා වූ පොලි අදායම නිවැරදිව ගණනය කර ගිණුම් තුළ ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | උපචිත පදනම මත සමාලෝචිත වර්ෂයට අදාල පොලී ආදායම ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට සහ අවසාන දිනට භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජනයන්හි මුළු වටිනාකම පිළිවෙළින් රු.2,144,317,223 ක් සහ රු.2,490,867,187 ක් වුවද, එය රු.2,141,652,055 ක් සහ රු.2,414,857,497 ක් ලෙස වරදවා දක්වා තිබීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ආයෝජනයන්හි වටිනාකම | 2023 වර්ෂය වන විට කල් පිරීමට ඇත්තේ තවත් භාණ්ඩාගාර බිල්පත් 03ක් පමණක වන අතර, ඒවා කල් පිරුණු පසු නැවත භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනයක් සිදු නොකරන අතර සියළුම කල්පිරුණු හා කල්පිරීමට නියමිත භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර සියල්ලම ස්ථාවර තැන්පතු වල ආයෝජනය කරන හෙයින් , මෙම ගැටළු සියල්ලම නිරාකරණය වන | භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීම, කල් පිරීම් සහ වාර්ෂික පොළිය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| රු.76,009,690 ක් අඩුවෙන් දක්වා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළ සිදු වූ රු.3,193,611,919 ක භාණ්ඩාගාර බිල්පත් කල් පිරීම් සහ රු.3,119,059,361 ක භාණ්ඩාගාර බිල්පත් නැවත ආයෝජන ගනුදෙනු 22 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ නිවැරදි භාණ්ඩාගාර බිල්පත් පොළී ආදායම රු.365,601,378 ක් වුව ද, අධිකාරිය විසින් එය රු.1,208,036.20 ක් වැඩියෙන් ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ආදායම ඊට සමාන අගයකින් වැඩියෙන් දක්වා තිබුණි. | බව. | |
| (ඇ) 2022 දෙසැම්බර් 31 දින වන විට සෘජුවම බැංකුව වෙත ලැබී තිබුණු රු.25,420,629 ක් නිසි පරිදි හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු නොකර හඳුනා නොගත් තැන්පතු ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ආදායම හා 2022 දෙසැම්බර් 31 දිනට ජංගම වගකීම් ශේෂය ඊට සමාන අගයකින් පිළිවෙළින් අඩුවෙන් සහ වැඩියෙන් දක්වා තිබුණි. | මෙම අගය හඳුනා ගැනීම බැංකු සැසඳුම් ප්‍රකාශ සැකසීමේදී සිදු වන අතර, මෙම වටිනාකම තුළ ඇතුලත් සියලු තැන්පතු සෘජුවම බැංකුව වෙත කරන ලද තැන්පතු බැවින් අධිකාරිය වෙත පැමිණ ඉන්වොයිස් පත් ලබා නොගත් වටිනාකම් වන බව සහ එබැවින් මෙම වටිනාකම හඳුනා නොගත් තැන්පතු ලෙස ගණුම් ගත කිරීමට සිදු වන අතර නිශ්චිතව මෙම අගය සඳහා උපලේඛන ඉදිරිපත් කළ නොහැකි බව. | විගණනයට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට පෙර සෘජු තැන්පතුවලට අදාළ ආදායම් ගිණුම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර කළ යුතුය. |
| (ඉ) අධිකාරිය පිහිටි කාර්යාල ගොඩනැගිල්ල, ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාර ගොඩනැගිල්ල හා එම ඉඩම් සහ වාහන 06 ක් අධිකාරිය වෙත පවරාගැනීමට, තක්සේරු කිරීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණු අතර අධිකාරිය වෙත පවරාගෙන තිබුණු වාහන 03 ක් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහන 06 සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටුවේ දී සාකච්ඡා වූ අතර සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ උපදෙස් මත ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබන බව සහ කාර්යාල ගොඩනැගිල්ල අධිකාරියට පැවරීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කඩිනමින් සිදු කරන බව. | අධිකාරිය පාවිච්චි කරන නමුත් අයිතිය පවරා ගෙන නැති සියළු වත්කම් පවරා ගෙන තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල (රු.) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අත්තිකාරම් ලැබීම් | 72,972,666 | විස්තරාත්මක උපලේඛන හා ලැබීම් විස්තර | මේ සම්බන්ධයෙන් 2023 වර්ෂයේ පැවති විගණන හා කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කළ අතර එම වටිනාකම සඳහා උපලේඛන සකස් කර ඉදිරිපත් කිරීමට කමිටුව විසින් උපදෙස් ලබා දුන් බව සහ ඒ අනුව මේ වන විට එම උපලේඛන සකස් කරමින් පවතින බව. | මෙම ශේෂය නිරවුල් කිරීමට හෝ මුදල් රෙගුලාසි 570 සහ 571 ප්‍රකාරව රාජ්‍ය ආදායමට බැර කිරීමට අවශ්‍ය කටයුතු ඉටු කළ යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනත | | | |
| 39(1) සහ 39(2) වගන්ති | විගණකාධිපතිවරයාගේ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ලැබී මාස 03ක් ඇතුළත, එම වාර්තාව සලකා බලා යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලකිල්ලට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව විගණකාධිපතිවරයාට, භාණ්ඩාගාර ලේකම්වරයාට සහ අදාළ අමාත්‍යවරයාට දැනුම් දිය යුතු අතර පෙන්වා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් හෝ කරුණක් පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකි වීමේ හේතු ඇත්නම් ඒ පිළිබඳව හේතු ඉදිරිපත් කළ යුතු වුවත් අධිකාරිය විසින් 2019, 2020 සහ 2021 වර්ෂවල විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව | අදහස් දක්වා නොතිබුණි. | ජාතික විගණන පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සම්බන්ධයෙන් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය ----------------- | | | |
| (i) මුදල් රෙගුලාසි 128(1)(ඉ), 507, 756, 757, 758, 770 හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/ 2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 11 ඡේදය | ගණන්දීමේ නිලධාරී විසින් සෑම මුදල් වර්ෂයකම දෙසැම්බර් 15 දිනට ප්‍රථම සමීක්ෂණ මණ්ඩල පත්කිරීමට හා එහි වාර්තා ඊලඟ වර්ෂයේ මාර්තු 31 දිනට පෙර ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත පිටපතක් සහිතව විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කළ යුතු වුවද, අධිකාරිය පිහිටවූ 2015 වර්ෂයේ සිටම මුළු පිරිවැය රු.191,539,373 ක්වූ ජංගම නොවන වත්කම් සමීක්ෂණය කර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2023 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින අතර එම කටයුතු අවසන් කළ විගස අදාල වාර්තා විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි හා රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 371(2) (ආ) හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/ 2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9.1(ආ) ඡේදය | මාණ්ඩලික නිලධාරියෙකුට පමණක් උපරිමය රු.100,000 ක තත්කාර්ය අත්තිකාරම් නිකුත් කළ හැකි වුවද,මාණ්ඩලික නොවන නිලධාරීන් වෙත අවස්ථා 90 කදී රු.1,862,050 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. තවද නිකුත් කළ අත්තිකාරම් පියවීමට ප්‍රථම නැවත අත්තිකාරම් නිකුත් කර තිබුණු අතර වියදම නිවැරදිව ඇස්තමේන්තු නොකිරීම හේතුවෙන් අවස්ථා 19 කදී ලබා ගත් අත්තිකාරම් මුදලින් සියයට 50 කට වඩා වැඩි මුදලක් නැවත පියවා තිබුණි. | කමිටු සඳහා සහභාගී වන නිලධාරීන්ට මුදල් ලබා දීමෙන් පසු ඉතිරි මුදල් නැවත පියවන තෙක් ළඟ තබා ගනු ලබන අතර, 14 සේවක වර්ගීකරණයේ 14.2 වගන්තිය අනුව තෘතිය මට්ටමේ නිලධාරීන් මාණ්ඩලික නිලධාරී ලෙස සලකනු ලබන බැවින් පෙන්වා දී ඇති අවස්ථා 90 තුල අධිකාරියේ තෘතිය මට්ටමේ නිලධාරීන්ද ඇතුළත්ව ඇති බව. | එම |

(ඈ) භාණ්ඩාගාර චක්‍රලේඛ
------------------

| | | | |
|---|---|---|---|
| 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම තම ආයතනය යටතේ වන සියලුම වත්කම් පිළිබඳව නිවැරදිව තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර එම කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා සෑම ආයතනයක් විසින්ම සුදුසු නිලධාරියකු නම් කළ යුතු වුවද, අධිකාරිය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මෙම කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා අධිකාරිය විසින් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ගණකාධිකාරී හා පරිපාලන නිලධාරී පත් කර ඇති බව. | චක්‍රලේඛයේ 13 ඡේදය ප්‍රකාරව අදාළ නිලධාරියාගේ තොරතුරු නියමිත ආකෘතියට අනුව කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත යැවීමට කටයුතු කළ යුතුය. |

(ඈ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ
----------------

| | | | |
|---|---|---|---|
| 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුබද්ධ කාර්ය මණ්ඩල සඳහා 2022 මැයි සිට 2023 අප්‍රේල් දක්වා විශේෂ දීමනා ලෙස රු.26,498,645 ක්ද, පැමිණීමේ දීමනා ලෙස රු.8,327,000 ක්ද, වශයෙන් එකතුව රු.34,825,645 ක් ගෙවා තිබුණි. | අංක 05 දරණ ජාතික ඖෂධ නියාමන අධිකාරී පනතෙහි 16(2)(1)(ආ) සහ (ඇ) ප්‍රකාරව සේවා නියුක්තකයන් සඳහා ගෙවිය යුතු පාරිශ්‍රමිකය නියම කිරීමට සහ කාර්ය මණ්ඩල සුභසාධන සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම පිහිටුවා දායකත්වය ලබා දිය හැකි අතර නිලධාරීන්ගේ සේවක තෘප්තිය ඇති කිරීම මඟින් නිලධාරින් අධිකාරිය තුල රඳවා ගැනීම සඳහා විශේෂ දීමනාවක් ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩල විසින් තීරණය කළ බව. | අදාළ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,294,424,519 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.567,192,769 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.727,231,750 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනය සඳහා ඉකුත් වර්ෂයට සාපේක්ෂව අධිකාරියේ මුළු ආදායම රු.1,029,745,170 කින් ඉහළ යාම ද දේශීය ගමන් වියදම්,

පර්යේෂණාගාර උපකරණ හා ගොඩනැගිලි නඩත්තු වියදම් සහ වෙනත් දීමනා රු.66,367,458 කින් අඩු වීම ද ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ 14(ඒ) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරිය විසින් බලපත්‍ර යටතේ ආනයනය කරන ලද ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාස්ථ නිෂ්පාදන හෝ විමර්ශනාත්මක ඖෂධීය නිෂ්පාදනවල ප්‍රමාණය පිළිබඳ දත්ත රැස් කර නොතිබුණි. | තාවකාලික පිළියමක් වශයෙන් 2022.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආනයනික ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාස්ථ නිෂ්පාදනවල ප්‍රමාණය පිළිබඳ විස්තර ජාතික ඖෂධ නියාමන අධිකාරියට දන්වන ලෙස 2022.02.23 වන දින දැන්වීමක් නියාමන අධිකාරියේ වෙබ්අඩවියෙහි පලකොට ඇති අතර, මෙම දත්ත ක්‍රමානුකූලව රැස්කිරීම හා පවත්වාගෙන යාමට ජාතික ඖෂධ නියාමන අධිකාරිය තුළ Market Surveillance (වෙළඳපල නිරීක්ෂණ) යනුවෙන් අංශයක් ස්ථාපිත වියයුතු බව ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් benchmark (මිනුම් ලකුණ) ක්‍රියාවලිය හරහා නිර්දේශ කර ඇති බව සහ ඊට අවශ්‍ය කටයුතු මීට වසර කිහිපයකට ඉහත දී ආරම්භ කිරීමට කටයුතු කළද මේ දක්වා ක්‍රමවත් පුළුල් වැඩ පිළිවෙලක් එයට අදාළ වෙනත් රාජ්‍ය ආයතන සමග ක්‍රියාත්මක කිරීමේ අපහසුතාවයට මුහුණ පා සිටින බව. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) පනතේ 41 (2), 66 (2) හා 87 (2) උප වගන්ති ප්‍රකාරව, වෛද්‍ය විද්‍යාව, ඖෂධ වෛද්‍ය විද්‍යාව හා ඖෂධවේදය හෝ වෙනත් අදාළ විෂයයන් පිළිබඳ උපාධියක් සහිත නිලධාරියෙකු, ඖෂධ නියාමන (Medicine Regulatory) අංශයේ, වෛද්‍ය උපකරණ නියාමන (Medicine Devices Regulatory) අංශයේ හා සීමාස්ථ නිෂ්පාදන නියාමන (Border Line Production Regulatory) අංශයේ ප්‍රධානීන් ලෙස පත්කර නොතිබුණි. | ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත සහ අනුමත කාර්ය මණ්ඩල තනතුරු අධිකාරියෙහි සේවා අවශ්‍යතාවය මත සංශෝධනය කරමින් පවතින අතර, එකී සංශෝධනයන් ද සළකා බලා ඉහත කී තනතුරු සඳහා බඳවා ගැනීම් සහ මේ වන විට සේවයේ නියුතු ඖෂධවේදීන් සුදුසුකම් මත අන්තර්ග්‍රහණය කර අවසන් වූ වහාම අධිකාරියේ ස්ථිර කාර්ය මණ්ඩලයට බඳවා ගන්නා නිලධාරින් අතරින් සුදුසුකම් ලත් නිලධාරින් නියාමන කටයුතු සම්බන්ධ අංශයන්හි ප්‍රධානීන් ලෙස ඉදිරියේ දී පත් කිරීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කරන බව. | එම |

| | | |
|---|---|---|
| (ඇ) පනතේ 43(2) (අ) හා (ආ) සහ 68 (2) (අ) හා (ආ) උප වගන්ති ප්‍රකාරව, ඖෂධ ඇගයීම් කමිටුව හා වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුව වෙත ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලබන ඖෂධ හා වෛද්‍ය උපකරණවල ප්‍රතිලාභ, අවදානම්, ප්‍රත්‍යක්ෂභාවය, තත්ත්වය, ආරක්ෂාකාරී බව, අවශ්‍යතාවය, මිල සහ අවශ්‍ය අවස්ථාවලදී එම ඖෂධවල ආර්ථික විශ්ලේෂණය නිශ්චිතව දක්වමින් තාක්ෂණික ඇගයීම් වාර්තාවක් අධිකාරිය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මාසිකව පැවැත්වෙන ඖෂධ ඇගයීම් කමිටුව (MEC) වෙත සියලු ඖෂධ අයදුම්පත් ඇගයීම් කර නිර්දේශ ඉදිරිපත් කිරීමෙන් පසු එම කමිටු වාර්තාව අධිකාරිය වෙත ලබා දෙන අතර ඒ සඳහා කමිටු සංදේශය (Board Memo) ඖෂධ නියාමන අංශයට ලබා දෙන බව සහ මෙහිදී අධිකාරියට යම් ඖෂධයක ඇගයීමේ ක්‍රියා පටිපාටිය සම්බන්ධව විස්තරාත්මකව සොයා බැලීමට අවශ්‍ය වුවොත් ඒ සඳහා අදාල ලිපි ලේඛන ඖෂධ නියාමන අංශය සතුව පවතින බව. | එම |
| (ඉ) පනතේ 58,59,82 , 83 හා 109 වගන්ති ප්‍රකාරව යම් ඖෂධයක් හෝ වෛද්‍ය උපකරණයක් අධිකාරියේ ලියාපදිංචි නොකර හා අධිකාරියෙන් බලපත්‍රයක් ලබා නොගෙන නිෂ්පාදනය කිරීම හෝ ආනයනය කිරීම නොකළ යුතු අතර ජීවිතයක් බේරාගැනීමට, බෝවන රෝග හෝ වසංගත රෝගයක් පැතිරීම වැළැක්වීමට, ජාතික අවශ්‍යතාවයක් හා ජාතික ආරක්ෂාව වැනි විශේෂිත අවස්ථාවලදී පමණක් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීමට අධිකාරිය වෙත බලය ලැබී තිබුණි. නමුත් වෙනත් හේතු මත සමාලෝචිත වර්ෂය තුළදී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හා වෛද්‍ය සැපයීම් අංශය වෙනුවෙන් ඖෂධ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි 286 ක් නිකුත් කර තිබුණි. පෞද්ගලික සමාගමක් වෙත එලෙස නිකුත් කර තිබුණු ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතික 38 ක් පරීක්ෂාවේ දී අධිකාරිය විසින් අදාළ ඖෂධ ඇගයීම් සිදු කර නොමැති බවත්, ඒ හේතුවෙන් අදාළ ඖෂධවල ගුණත්වය , ආරක්ෂාකාරී බව සහ ප්‍රත්‍යක්ෂබව පිළිබඳව අධිකාරිය වගනොකියන බවටත්, වගකීම වෛද්‍ය සැපයීම් අංශයේ අධ්‍යක්ෂ විසින් භාරගත යුතු බවටත් කොන්දේසි ඉදිරිපත් කරමින් එහි වගකීම අධිකාරිය විසින් අත්හැරීම | විශේෂ අවස්ථානුගත කරුණුවල දී සෞඛ්‍ය අමාත්‍යාංශය නිර්දේශය මත නිදහස් ලිපි නිකුත් කරනු ලබන අතර, වාණිජමය වශයෙන් ප්‍රතිලාභයන් අඩු ඖෂධ, ඖෂධ සමාගම් විසින් ලියාපදිංචි කිරිමට උනන්දුවක් නොදක්වන තත්වයක හා එසේ වුවද රෝගීන් සඳහා එම ඖෂධ අත්‍යවශ්‍යම අවස්ථාවකදී එම ඖෂධ ආනයනය සඳහා ක්‍රමවේදයක් සැකසීම අත්‍යවශ්‍ය කරුණක් බැවින් එවැනි ඖෂධ අයදුම්පත් ද මෙම නිදහස් ලිපි නිකුතුවට ඇතුළත් බව සහ වෙනත් නියාමන අධිකාරීන් ද මෙවැනි ලියාපදිංචි නොකළ ඖෂධ සඳහා නිෂ්කාශන අනුමැතිය ලබාදෙන විට ඖෂධ වල ගුණාත්මක බව, ආරක්ෂාකාරී බව, ප්‍රත්‍යක්ෂතාව පිළිබඳ ඇගයීමක් නොකරණ බැවින්, ඒ සඳහා අධිකාරිය වග නොකියන බවට වන ප්‍රකාශයක් සඳහන් කරන බව. | පනතේ සඳහන් විශේෂිත අවස්ථාවලදී පමණක් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීමට කටයුතු කිරීම තුළින් තත්ත්වය පිළිබඳ සහතිකයක් නොමැති ඖෂධ රට තුළට ඇතුල්වීම අවම කර ගත යුතුය. |

| | | |
|---|---|---|
| විගණනයේ දී මතභේදයට තුඩු දෙන කරුණක් විය. | | |
| (ඊ) පනතේ 60 (2), 61, 84(2), 85, 103(2) හා 104 වගන්ති හා උප වගන්ති ප්‍රකාරව අධිකාරිය විසින් ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ලියාපදිංචි කිරීම මෙන්ම ලියාපදිංචිය ප්‍රතික්ෂේප කළ අවස්ථාද ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මඟින් මහජනතාව වෙත දැනුම් දිය යුතු වුවද, අධිකාරිය ස්ථාපනය කළ දින සිට මේ දක්වා ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. | දිනපතා වෛද්‍ය උපකරණ ලියාපදිංචියට අවශ්‍ය කටයුතු සිදු වන බැවින් දෛනිකව හෝ මාසිකව ගැසට්පත් නිකුත් කිරීම ප්‍රායෝගිකව අපහසු අතර අයදුම්පතෙහි අංකය සහිතව වෙබ් පිටුවෙහි පල කිරීමට කටයුතු සිදු කරනු ලබයි තවද නිශ්චිත කාල සීමාවක් තුල ගැසට් පත්‍රයක් මගින් නිර්දේශ වන හා නොවන වෛද්‍ය උපකරණ පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සලකා බලමින් සිටියි. ලියාපදිංචි කරනු ලබන සීමාස්ථ නිෂ්පාදන වල ලියාපදිංචිය පිළිබඳව සිංහල, දෙමළ , ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම මහජනතාව වෙත දැනුවත් කිරීම පිණිස ගැසට් පත්‍රයේ පලකිරීමට කටයුතු සලසමින් සිටී. එකී ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව මහජනතාව දනුවත් කිරීම සඳහා වන අවශ්‍යතාව හඳුනාගෙන ඇති අතර ඒ පිළිබඳව කටයුතු කිරීමට බලාපොරොත්තු වනු ලබයි. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (උ) පනතේ 69(1)(ආ)(v) උපවගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නාමිකයෙකු වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුවට පත් කර නොතිබුණි. වෛද්‍ය උපකරණද ඇතුළුව විකිරණශීලී උපකරණ හා ද්‍රව්‍ය ආනයනය හා භාවිතය සම්බන්ධයෙන් බලපත්‍ර නිකුත් කිරීම හා නියාමනය පිළිබඳ බලතල හිමි ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව විසින් වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුව නියෝජනය කිරීමේ අවශ්‍යතාවය ඉටුවී නොතිබුණි. | 2022 සැප්තැම්බර් 15 දිනැති අංක එන්එම්ආර්ඒ/එම්ඩීර්සී/9/22 දරන ලිපිය මගින් නිලධාරියෙකු පත් කිරීම සම්බන්ධයෙන් අධිකාරිය විසින් ඉල්ලීමක් සිදු කළ ද, මේ වන තෙක් ඒ සඳහා පිළිතුරක් නොමැති අතර තවදුරටත් මේ පිළිබඳ සිහි කැඳවීමේ ලිපියක් යැවීමට ඉදිරියේ දී බලාපොරොත්තු වන බව. | එම |
| (ඌ) පනතේ 72(1) හා 93(1) උප වගන්ති ප්‍රකාරව, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ඇගයීම සඳහා ඒ ඒ ඇගයීම් කමිටු වෙත පොදු මාර්ගෝපදේශ නිකුත් කළයුතු වුවද එවැනි මාර්ගෝපදේශ පිළියෙල කර නොතිබුණි. තවද 72(4) හා 93(4) උප වගන්ති ප්‍රකාරව අදාළ ඇගයීම් පැවැත්වීම සඳහා වූ නිශ්චිත | වෛද්‍ය උපකරණ ඇගයීම සඳහා මාර්ගෝපදේශ වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුව සමඟ සාකච්ඡා කර අවසන් අදියරයේ පවතින අතර, තවත් සාකච්ඡා වට කිහිපයකින් පසුව මාර්ගෝපදේශයන් පිළියෙල කිරීමේ කටයුතු අවසන් කිරීමට හැකි වන බව සහ මෙතෙක් පොදු මාර්ගෝපදේශ කිසිවක් සීමාස්ථ නියාමන අංශය වෙත ඉදිරිපත් | එම |

| | | |
|---|---|---|
| කාලසීමා ඇතුළු අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සඳහන් කරමින්, යහපත් නිෂ්පාදන පරිචයන් පිළිබඳ මාර්ගෝපදේශ සහ වෙනත් අදාළ මාර්ගෝපදේශ බලාත්මක කිරීම සඳහා ද නියෝග පිළියෙල කර නොතිබුණි. | කර නොමැති නමුත් වරින් වර අධිකාරිය විසින් ගනු ලබන තීරණ පිලිබඳව සීමාස්ථ නිෂ්පාදන නියාමන අංශය වෙත දැනුම් දෙනු ලබන අතර යහපත් නිෂ්පාදන පරිචයන් පිලිබඳව අධිකාරිය විසින් ඖෂධ සඳහා අනුගමනය කරනු ලබන මාර්ගෝපදේශයන් ම සීමාස්ථ නිෂ්පාදන නියාමන අංශයටද අදාලවන පරිදි ක්‍රියාත්මක කරන බව. | |
| (එ) පනතේ 74(1) හා 95(1) උප වගන්ති ප්‍රකාරව, අවසර දෙනු ලබන වෛද්‍ය උපකරණ හා ලියාපදිංචි කරන ලද සීමාස්ථ නිෂ්පාදන අමාත්‍යවරයා විසින් කලින් කළ ලැයිස්තුගත කර නොතිබුණි. | වෛද්‍ය උපකරණ ඇගයීම කාර්යක්ෂමව සිදු කර ගැනීම සඳහා මසකට කමිටු සහ අනු කමිටු තුනක් පමණ පැවැත්වෙන බැවින් එකී කමිටුවලින් ලබා දෙනු ලබන නිර්දේශයන් අයදුම්පතෙහි අංකය සහිතව වෙබ් පිටුවෙහි පල කිරීමට කටයුතු කරන අතර, දිනපතා වෛද්‍ය උපකරණ ලියාපදිංචියට අවශ්‍ය කටයුතු සිදු වන බැවින් දෛනිකව හෝ මාසිකව ගැසට්පත් නිකුත් කිරීම ප්‍රායෝගිකව අපහසු කරුණක් බව සහ නිශ්චිත කාල සීමාවක් තුල ගැසට් පත්‍රයක් මගින් නිර්දේශ වන හා නොවන වෛද්‍ය උපකරණ පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සලකා බලමින් සිටින අතර 2023 මැයි 22 දක්වා ලියාපදිංචි කරන ලද සීමාස්ථ නිෂ්පාදන භාෂා ත්‍රිත්වයෙන්ම ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු සකස් කරමින් පවතින බව. | එම |
| (ඒ) පනතේ 83 (4)(ආ) හා 102(4)(ආ) උප වගන්ති ප්‍රකාරව ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලබන වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදනවල තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | සියලු උපකරණවල තත්ත්වය පරීක්ෂාගාරයක පරීක්ෂා කිරීම සිදු කළ නොහැකි අතර, සායනික පරීක්ෂණ, උපකරණ පර්යේෂණ වාර්තා ඇගයීම, රසායනාගාර පර්යේෂණ වාර්තා ඇගයීම, අවසන් පරිශීලකයන් වෙත එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රදර්ශනය/ඉදිරිපත් කිරීමෙන් මඟින් ද නිර්දේශයන් ලබා දෙන බව සහ සෑම වෛද්‍ය උපකරණයක්ම ලියාපදිංචියට පෙර සම්පල ඇගයීම ප්‍රායෝගික අපහසු කරුණක් මෙන්ම තාක්ෂණිකවද අනවශ්‍ය කාරණාවක් වන බැවින් නියාමන රඳාපැවතීම් (Regulatory Reliance) භාවිතා කරමින් ඇගයීම් කටයුතු සිදු කරන බව, සීමාස්ථ නිෂ්පාදනයන්හි තත්වය පරීක්ෂා කිරීම සඳහා ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ | එම |

| | | |
|---|---|---|
| | පර්යේෂණාගාරය (NMQAL) වෙත නියැදි ලියාපදිංචියට පෙර ලබාදීමක් සිදු නොකරන අතර මීට හේතු වන්නේ සීමාස්ථ නිෂ්පාදන බොහොමයක ඖෂධ කාණ්ඩයට ගැනෙන විටමින්/මිනරල් හා ඖෂධ කාණ්ඩයට නොගැනෙනෙ අමුද්‍රව්‍ය අඩංගු වීම බැවින් එම නිෂ්පාදන පරීක්ෂා කිරීමේ හැකියාව නොපවතින ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය වෙත එම නිෂ්පාදන පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් නොකරන බව. | |
| (ඔ) පනතේ 83(6) හා 102(6) උප වගන්ති ප්‍රකාරව අමාත්‍යවරයා විසින්, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ඇගයීම් කමිටු සහ ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය යන ආයතන විසින් පරීක්ෂා කිරීමේ හෝ ඇගයීමේ ක්‍රියාවලියේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටි, එම ක්‍රියාවලියේ කාල සීමාවන්, රැස්වීම් පැවැත්විය යුතු ආකාරය, රැස්වීම්වලදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටි සහ ඉදිරිපත් කළ යුතු වාර්තාවල ඇතුළත් කළ යුතු කරුණු නිශ්චිතව දක්වමින් නියෝග පිළියෙල කර නොතිබුණි. | වෛද්‍ය උපකරණ ඇගයීම සඳහා මාර්ගෝපදේශ වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුව සමඟ සාකච්ඡා කර අවසන් අදියරයේ පවතින අතර, තවත් සාකච්ඡා වට කිහිපයකින් පසුව මාර්ගෝපදේශයන් පිළියෙල කිරීමේ කටයුතු අවසන් කිරීමට හැකි වන බව සහ සීමාස්ථ නිෂ්පාදන නියාමනයට අදාල කරුණු ඖෂධ නියාමන පනත ප්‍රකාරව සංශෝධනය වියයුතු බව වරින් වර සාකච්චාවට බඳුන් වූ අතර සීමාස්ථ නිෂ්පාදන අංශය විසින්ද ඒ සඳහා අදහස් හා යෝජනා ඉදිරිපත් කළ අතර පනත ක්‍රියාත්මක වන තුරු ශ්‍රී ලංකාව තුළ සීමාස්ථ නිෂ්පාදන නියාමනයට ලක්විය යුතු කාණ්ඩයක් ලෙස හඳුනාගෙන නොපැවතීමත්, ඊට අදාළ පෙර විමසුම් සඳහා කිසිදු නීතිමය ලියවිලි, රෙගුලාසි මාර්ගෝපදේශ හෝ ජාත්‍යන්තර මට්ටමින් එකඟවන පිරිවිතරයන් නොපැවතීමද රෙගුලාසි හා මාර්ගෝපදේශ සකස් කිරීමේ ක්‍රියාවලිය ප්‍රමාද වීමට හේතු වූ බව සහ ඒ අනුව සීමාස්ථ නිෂ්පාදන සඳහා නිවැරදි ලෙස නියෝග සදා ගැනීමේ වටපිටාවක් මේ දක්වා නිර්මාණය වී නොමැති බව. | එම |
| (ඕ) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ 123 වගන්තිය ප්‍රකාරව, අධිකාරිය වෙත ඉදිරිපත් කරන අභියාචනා අසා තීරණය කිරීම සඳහා අභියාචනා කමිටුවක් පිහිටුවා නොතිබුණි. | අභියාචනා කමිටුවක් පත් කිරීම සඳහා 2023 මාර්තු 17 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී තීරණය වූ අතර අධිකාරී පනතේ අදාල වගන්තිය ප්‍රකාරව අභියාචනා කමිටුව පත් කළ යුතු වන්නේ අමාත්‍යවරයා විසින් බැවින් අභියාචනා කමිටුව පත් කර දෙන මෙන් සෞඛ්‍ය අමාත්‍යවරයාගෙන් ඉල්ලීමක් සිදු කිරීමට මේ වන විට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | එම |

| | | |
|---|---|---|
| (ක) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි II කොටසෙහි 5.1 ඡේදය ප්‍රකාරව සියළුම රජයේ ආයතන, තම ආයතනය විසින් මහජනතාවට සපයනු ලබන සේවාවන් සඳහා අයකරනු ලබන ගාස්තු සමාලෝචනය කර වසර තුනකට වරක් සියයට 15 ක උපරිමයකට යටත්ව සංශෝධනය කළ යුතු වුවද අධිකාරිය විසින් ඊට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ද රු.306,176,273 ක ගාස්තු ආදායම් අධිකාරියට අහිමි වී තිබුණි. තවද, 2022 දෙසැම්බර් 20 දිනැති අංක 01/2020(ii) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් 2020, 2021 සහ 2022 වර්ෂවල දී සේවා ගාස්තු ඉහළ නැංවීමක් සිදු කර නොමැති සියලුම රාජ්‍ය ආයතන විසින් සිය ගාස්තු සියයට 20 කින් ඉහළ නැංවීමට කටයුතු කර 2023 මාර්තු 31 දිනට පෙර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතු බව අවධාරණය කර තිබුණ ද, අධිකාරිය විසින් මේ වන තෙක් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණු අතර චක්‍රලේඛය අභිබවා ගාස්තු සංශෝධනයෙන් වැළකී සිටීම සඳහා විධිමත් අනුමැතියක් ද ලබා ගෙන නොතිබුණි. | 2022 මාර්තු 07 දින පවත්වන ලද සෞඛ්‍ය අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී මේ සම්බන්ධයෙන් කළ සාකච්ඡාවේදී “රුපියලට සාපේක්ෂව දැනට පවතින ඩොලර් අගයත්, මේ වන විට අධිකාරිය වෙත ලැබෙන සේවා ගාස්තු අදායමත් සලකා සේවා ගාස්තු සංශෝධනය කිරීම කෙසේ සිදුවිය යුතු දැයි ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පාලනාධිකාරිය මගින් තීරණයක් ගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බව” භාණ්ඩාගාර නියෝජිතතුමා විසින් දන්වා ඇති අතර ඒ අනුව මේ සම්බන්ධයෙන් දැනුවත් කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර එහිදී ගනු ලබන තීරණ අනුව ඉදිරි කටයුතු සිදු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීමට හෝ චක්‍රලේඛය අභිබවා ගාස්තු සංශෝධනයෙන් වැළකී සිටීම සඳහා විධිමත් අනුමැතියක් ලබා ගත යුතුය. |
| (ග) 2018 ජනවාරි 05 දිනැති අංක 2052/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ අංක 02, 03 හා 04 දරන ගාස්තු නියෝගයන් ප්‍රකාරව ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදනවල පෞද්ගලික සැපයීම් සඳහා ලියාපදිංචියෙන් නිදහස් කිරීමට ඉල්ලුම් කිරීමේදී ගාස්තු අය කළ යුතු වුවද, ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ අනුමැතිය ප්‍රදානය කිරීමේ දී ගාස්තු අය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ දී ප්‍රතික්ෂේප කර තිබුණු පෞද්ගලික අංශයේ වෛද්‍ය උපකරණ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ඉල්ලුම්පත් 123 ක් සඳහා | 2018 ජනවාරි 05 දිනැති ගැසට් පත්‍රය නිකුත් වීමටත් ප්‍රථම සිට අධිකාරියට ලැබෙන ලියාදිංචියෙන් නිදහස් කිරීමේ ඉල්ලුම්පත්‍ර සඳහා දීර්ඝ කාලීනවත් පෙර පැවති ආයතනයේ අනුගමනය කළ ක්‍රමවේදය ම දිගටම ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇති අතර, සිතා මතා ගැසට් පත්‍රය අභිබවා යාමට ගත් උත්සාහයක් නොවන බවත්, විගණනයෙන් ඒ පිළිබඳ පෙන්වා දුන් වහාම එහි බරපතලකම අවබෝධ කොටගෙන 2023 ජනවාරි 25 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛයට අනුව 2018 ජනවාරි 05 දිනැති අංක 2052/33 දරණ ගැසට් පත්‍රය ප්‍රකාරව රාජ්‍ය අංශයේ සැපයීම් සඳහා අනුමැතිය ලබා දීමෙන් | රජයට සිදු වූ අති විශාල ආදායම් අහිමි වීම සඳහා වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 128(ජ) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අය කළ හැකිව තිබුණු රු.10,686,209 ක ගාස්තු අධිකාරියට අහිමි වී තිබුණි. 2023 ජනවාරි 25 දින මෙය නිවැරදි කිරීම සඳහා අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කර තිබුණ ද, 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ගාස්තු නියෝගයට පටහැනිව කටයුතු කිරීමෙන් රජයට සිදු වූ අති විශාල ආදායම් අහිමි වීම සඳහා වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 128(ජ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පසුවද, පෞද්ගලික අංශයේ සැපයීම් සඳහා ඉල්ලුම් කිරීමේදී ද ගාස්තු අය කිරීම සිදු කරන බව. | |
| (ච) | නියැදි විශ්ලේෂණයන් සඳහා අංක 2052/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ අංක 02, 03 හා 04 දරන ගාස්තු ගාස්තු නියෝගයෙහි vii වන උපලේඛනයන් ප්‍රකාරව ගාස්තු අය කළ යුතු අතර එහි විශ්ලේෂණ ගාස්තුවලින් නිදහස් නියැදි පිළිබඳව විධිවිධාන ඇතුළත්ව නොතිබුණු නමුත් අධිකාරිය විසින් රජයේ රෝහල්, වෛද්‍ය සැපයීම් අංශය සහ අධිකරණ වැනි රාජ්‍ය ආයතන විසින් ඉදිරිපත් කරනු ලබන නියැදි සඳහා ගාස්තු අය කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ දී විශ්ලේෂණය සඳහා ලද නියැදි 378 කින් 328 ක් සහ ඉකුත් වර්ෂය තුළ ලද නියැදි 477 කින් 421 ක් සඳහා විශ්ලේෂණ ගාස්තු අය කර නොතිබුණි. | ඖෂධ නියාමන අධිකාරිය පිහිටු වීමට පෙර සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ නිරීක්ෂණ වැඩසටහන (Surveillance) යටතේ පරීක්ෂණාගාර නිලධාරීන් රජයේ සෞඛ්‍ය ආයතන වෙත ගොස් සාම්පල ලබා ගැනීම සිදු කළ අතර එම සාම්පල් ලබා ගැනීමේදී මුදල් අය නොකළ බව සහ පැමිණිලි සාම්පල පරීක්ෂණාගාරය වෙත ලැබීම දිරිමත් කිරීමේ අරමුණින් මෙම ක්‍රියාමාර්ගය ජාතික ඖෂධ නියාමන අධිකාරිය පිහිටුවීමෙන් පසුවද ක්‍රියාත්මක කළ අතර, ඒ සඳහා මුදල් ගෙවිය යුතු ආකාරය පිළිබඳ තීරණයක් ගෙන නොමැති බැවින් මෙය මහජන සෞඛ්‍ය ආරක්ෂණ සේවාවක් ලෙස මහජනතාවගේ සුභසිද්ධිය සඳහා පෙර කළ පරිදි තවදුරටත් ක්‍රියාත්මක කරන බව. | විශ්ලේෂණ ගාස්තුවලින් නිදහස් කරන නියැදි සම්බන්ධයෙන් විධිමත් අනුමැතියක් ලබා ගෙන ගාස්තු නියෝගය සංශෝධනය කළ යුතුය. |
| (ජ) | ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය (National Drugs Quality Assurance Laboratory) විසින් පර්යේෂණාගාරයේ ප්‍රමිතිය සම්බන්ධයෙන් අනුකූලතා තක්සේරු පිළිබඳ සහතිකය ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය වෙත 2020 පෙබරවාරි 06 දින අයදුම්පතක් ඉදිරිපත් කර තිබුණු නමුත් මේ වන විටත් එම ප්‍රමිති සහතිකය ලබාගැනීමට අපොහොසත්වී තිබුණි. | සමාලෝචන වාර්තාවේ දක්වා තිබූ අඩුපාඩු සකස් කොට යැවීමෙන් අනතුරුව 2021 නොවැම්බර් 26 දින අතථ්‍ය තක්සේරුවක් (virtual assessment) පවත්වන ලද අතර තව දුරටත් සකස් කළ යුතු අඩුපාඩු පිළිබඳව 2023 මාර්තු 20 දින දැනුම් දුන් බව සහ ස්ථානීය තක්සේරුව (on-site assessment) සඳහා 2023 ජූලි 05 වන දිනය යොදා ගත් බව ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් 2023 මැයි 03 වන දින ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය වෙත දැනුම් දුන් බව. | මෙම සහතිකය ලබාගැනීම සඳහා අවශ්‍ය මූලික අවශ්‍යතා සපයා ගැනීමට උපරිම උත්සාහයක් ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ට) 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ 39 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළදී ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය වෙත ඉදිරිපත් කර තිබුණු ඖෂධ නියැදි 378 කින් නියැදි 241 ක් පමණක් පරීක්ෂා කර තිබුණු බැවින් ප්‍රගතිය සියයට 64 ක් පමණක් විය. තවද, පනතේ 39(4) වගන්තිය සහ පරීක්ෂණාගාරයේ මෙහෙයුම් ක්‍රියාපටිපාටිය (Standard Operating Procedures) ප්‍රකාරව දින 90 ක් ඇතුළත පරීක්ෂණ වාර්තාව නිකුත් කළ යුතු වුවද, 2019 සිට 2021 වර්ෂය දක්වා ඉදිරිපත් වූ නියැදි 47 ක වාර්තා සමාලෝචිත වර්ෂය අවසාන වන විට නිකුත් කර නොතිබුණු අතර විගණිත දිනය වන 2023 මැයි 08 දින වන විටත් ඉන් නියැදි 37 ක වාර්තා නිකුත් කර නොතිබුණි. | 2015 වර්ෂයේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පිහිටුවීමට පෙර සිටි අනුමත තාක්ෂණික කාර්ය මණ්ඩලයෙන් 1/3 කටත් අඩු තාක්ෂණික නිලධාරීන් පිරිසක් රාජකාරියේ නිරත වන අතර පරීක්ෂණාගාරයේ මෙහෙයුම් ක්‍රියාපටිපාටිය (Standard Operating Procedure) අනුව දින 90ක් ඇතුළත අදාල සාම්පල වල විශ්ලේෂණයන් සිදු කර තත්ත්ව වාර්තා නිකුත් කිරීම අසීරු කරුණක් වී ඇති බව සහ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පිහිටුවීමෙන් පසු පරීක්ෂණාගාරයේ කටයුතු සඳහා නව තාක්ෂණික නිලධාරීන් මේ දක්වා බඳවා ගෙන නොමැති වුවත් පවතින තාක්ෂණික කාර්ය මණ්ඩලය යටතේ උපරිම උත්සහයක නිරත වුවද ඇතැම් අවස්ථා වල තත්ත්ව වාර්තා නියමිත පරිදි නිකුත් කිරීම ගැටලුකාරී වී ඇති බව. | පර්යේෂණාගාරය වෙත ඉදිරිපත් කරන ඖෂධ සාම්පල්වලට අදාළ තත්ත්ව වාර්තා නියමිත කාලය තුළ නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඩ) අධිකාරියේ දත්ත පද්ධතිය ස්වයංක්‍රියකරණය කිරීමේ කොන්ත්‍රාත්තුව රු.මිලියන 29 කට වර්ෂ 05 ක කාලයක් සඳහා පෞද්ගලික සමාගමක් වෙත ප්‍රදානය කර තිබුණු අතර 2021 මැයි මස වන විට රු.12,253,328 ක් ගෙවා තිබුණි. නමුත් අදාළ පෞද්ගලික සමාගමේ නොසැලකිල්ලෙන් හෝ හිතාමතා මෙම දත්ත පද්ධතියට ඇතුළත් කර තිබුණු ඇතැම් තොරතුරු මකා දමා තිබුණු අතර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශන කටයුතු අවසන් වන තෙක් මෙම සේවාව අක්‍රිය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පත්කළ විශේෂඥ කමිටුව විසින් 2022 ජූලි 15 දින ඉදිරිපත් කරන ලද වාර්තාව මගින් පද්ධතියෙන් මකා දමා තිබුණු දත්ත නැවත ස්ථාපනය කළ නොහැකි බව දන්වා තිබුණු අතර මේ වන තෙක් සිදු වූ පාඩුව අය කර ගැනීමට හෝ අදාළ සමාගමට විරුද්ධව ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ දත්ත පද්ධතියට අයත් තොරතුරු විනාශ වී ඇති බව අධිකාරිය විසින් සිදු කරන ලද පැමිණිල්ලට අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ කරුණු වාර්තා කර ඇති අතර, එකී නඩුවේ පැමිණිල්ල වෙනුවෙන් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය වෙනුවෙන් නීතිපති පෙනී සිටින බව සහ මෙම නඩුවට අදාළ විමර්ශන කටයුතු තවදුරටත් පැවැත්වෙමින් තිබෙන බැවින් හා අනෙකුත් කටයුතු සිදු කෙරෙමින් පවතින බැවින් එම කටයුතු අවසන් වූ පසු, පාඩුව අයකරගැනීමට හෝ අදාළ සමාගමට විරුද්ධව ක්‍රියාමාර්ගයන් ගැනීමට කටයුතු කරන බව. | අධිකාරියේ දත්ත පද්ධතියේ පවත්නා අඩුපාඩු නිවැරදි වන අකාරයට පහසුවෙන් මෙහෙයවිය හැකි සුදුසු තොරතුරු පද්ධතියක් කඩිනමින් ස්ථාපිත කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 80 කදී ආපසු ගෙවා තිබුණු රු.5,604,061 ක ආදායම්වලින් රු.3,021,246 ක් පූර්ව වර්ෂවලට අදාළ ආදායම් වූ අතර එම ආදායම් පදනම් කරගෙන අධිකාරිය විසින් මේ වන විටත් රු.460,573 ක අතිරේක ආදායම් බද්දක් ගෙවා තිබුණි. තවද, මුළු ආදායම් ආපසු ගෙවීම්වලින් සියයට 48 ක් හෙවත් රු.2,701,407 ක් අධිකාරියේ නිලධාරින්ගේ නොසැලකිල්ල හා වැරදි හේතුවෙන් වැඩිපුර අය කළ ගාස්තු විය. | එකතු කළ ආදායම් ආපසු ගෙවීම් සම්බන්ධයෙන් මේ වන විට අධිකාරියේ නිලධාරීන් දැනුවත් කර උපදෙස් ලබා දී ඇති අතර එම කටයුතු කමිටුවක් මගින් සිදු කරනු ලබන බව. | ආදායම් ආපසු ගෙවීම් අවස්ථා අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඖෂධ තොරතුරු ප්‍රතිසංස්කරණ දත්ත පද්ධතිය සකස් කිරීමේ (Revamping the Medicine Database) කොන්ත්‍රාත්තුව 2020 නොවැම්බර් 11 දින පෞද්ගලික ආයතනයක් වෙත ප්‍රදානය කර තිබුණ ද, 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) ප්‍රකාව විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ නොතිබුණි. තවද, මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 ප්‍රකාරව වැඩ අවසන් කිරීම පිළිබඳ සහතිකයක් ලබා ගැනීමෙන් තොරව 2021 දෙසැම්බර් 31 දින වන විට රු.4,774,752 ක් ගෙවා තිබුණු ද, මෙම පද්ධතිය මේ වන විටත් නිෂ්කාර්යව පැවතුණි. | මෙම පද්ධතිය සඳහා ගෙවීම් කිරීමේදී මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 ප්‍රකාරව වැඩ අවසන් කිරීම පිළිබඳ සහතිකයක් (අදාළ ගොනුව තුළ සටහනක් යෙදීම මඟින්) ලබා ගැනීමෙන් පසුව මෙම ගෙවීම් කර ඇති බව සහ මෙම දත්ත පද්ධතිය භාවිත කිරීමේදී යම් දෝෂ සහගත තත්ත්ව ඇති වූ බැවින් මෙම දත්ත පද්ධතිය වෙත තොරතුරු ඇතුලත් කිරීම තාවකාලිකව නවතා දැමූ අතර එම දෝෂ සකස් කිරීමෙන් පසු නැවත දත්ත ඇතුලත් කිරීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර කඩිනමින් පද්ධතියේ දෝෂ සකස් කර භාවිතයට ගත යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනට අනුමත ස්ථිර කාර්යමණ්ඩලය 235 ක් සහ කොන්ත්‍රාත් පදනම මත 22 ක් ලෙස මුළු අනුමත කාර්යමණ්ඩලය 257 ක් විය. මුළු තථ්‍ය කාර්යමණ්ඩලය 158 ක් වුවද ඉන් 37 දෙනෙක් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවන අතිරික්ත සංඛ්‍යාවක් වූ බැවින් 2022 දෙසැම්බර් 31 දිනට අනුමත මුළු කාර්ය මණ්ඩලයෙන් සත්‍ය පුරප්පාඩු සංඛ්‍යාව 135 ක් විය. | මේ වන විට අධිකාරිය සඳහා තනතුරු 235 ක් සහ කොන්ත්‍රාත් පදනම මත ඖෂධ විශ්ලේෂක තනතුරු 12ක් හා කළමනාකරණ සහකාර තනතුරු 10ක් අනුමත වී ඇති අතර, 2022 දෙසැම්බර් 31 දින වන විට තත්‍ය කාර්යමණ්ඩලය 158ක් බව. | අවශ්‍ය හා අවශ්‍ය නොවන තනතුරු හඳුනාගෙන අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2020 නොවැම්බර් දින 03 අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය තුළ වූ ඖෂධවේදී තනතුරු 70 ක් අහෝසි කරමින් ඖෂධ ඇගයීම් නිලධාරී තනතුරු 30 ක් සහ සහකාර ඖෂධ ඇගයීම් නිලධාරී තනතුරු 40 ක් ලෙස නව තනතුරු 70 ක් අනුමත කරවා ගෙන තිබුණි. නමුත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් සහකාර ඖෂධ ඇගයීම් නිලධාරීන් 28 දෙනෙකු පමණක් බඳවා ගෙන තිබුණු බැවින් ඖෂධ ඇගයීම් නිලධාරීන් 30 දෙනකු සහ සහකාර ඖෂධ ඇගයීම් නිලධාරීන් 12 දෙනෙකුගේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශ පරිදි අන්තර්ග්‍රහණය කිරීමේ හෝ බඳවා ගැනීමේ ක්‍රමවේදය මෙම වාර්තාවේ දිනය වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. මෙම පුරප්පාඩු තනතුරුවලට අදාළ කාර්යභාරයන් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් අනුයුක්ත කරන ලද මේ වන විට අහෝසි කරන ලද තනතුරක් වන ඖෂධවේදී තනතුරු දරන නිලධාරීන් 37 දෙනෙකු විසින් සිදු කරන අතර ඖෂධ ඇගයීම් නිලධාරී තනතුරු සඳහා අන්තර්ග්‍රහණය කිරීමේ ක්‍රමවේදය මත එම ඖෂධවේදීන්ට ඖෂධ ඇගයීම් නිලධාරී තනතුරුවලට අන්තර්ග්‍රහණයවීමේ අවස්ථාව පවතින නමුත් එම ක්‍රියාවලිය ප්‍රමාදවීම මත ඔවුන්ට අසාධාරණයක් සිදුවන බවත් එම තත්ත්වය ඔවුන්ගේ කාර්යසාධනය කෙරෙහි බලපෑ හැකි බවත් නිරීක්ෂණය විය. | ජාතික ඖෂධ නියාමන අධිකාරියට අනුමතව තිබූ ඖෂධවේදී තනතුරු 70 අහෝසි කරමින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2020 දෙසැම්බර් 21 දින ඖෂධ ඇගයීම් නිලධාරි තනතුරු 30ක් සහ සහකාර ඖෂධ ඇගයීම් නිලධාරි තනතුරු 40ක් අනුමත කරන ලද අතර ඒ සඳහා වන බඳවා ගැනීමේ පරිපාටි 2021 මාර්තු 31 දින අනුමත කළ බව සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අධිකාරියේ සේවයේ නියුතු ඖෂධවේදීන් ඖෂධ ඇගයීම් නිලධාරි සහ සහකාර ඖෂධ ඇගයීම් නිලධාරි තනතුරු සඳහා අන්තර්ග්‍රහණය කිරීමේ ක්‍රියාවලිය 2021 ජූනි 14 දින අනුමත කළ බව, ඒ අනුව 2021 ජූනි 13 දින පුවත්පත් දැන්වීම් පල කර, 2021 දෙසැම්බර් 15 දින සිට මේ වන විට සහකාර ඖෂධ ඇගයීම් නිලධාරින් 29 දෙනෙකු බඳවා ගත්තද, මේ වන විට ඉන් තිදෙනෙකු සේවයෙන් ඉල්ලා අස්වී 26 දෙනෙකු සේවයේ නිරත වන අතර අධිකාරියේ සේවයේ නිරත ඖෂධවේදීන් අධිකාරියට අන්තර්ග්‍රහණය කිරීම සිදු කළ යුතු බැවින් 2021 දෙසැම්බර් 30 දින ඔවුන් ඖෂධ ඇගයීම් නිලධාරි හා සහකාර ඖෂධ ඇගයීම් නිලධාරි තනතුරු සඳහා අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස සෞඛ්‍ය ලේකම් වෙත ද දැනුම් දී ඇති බව සහ ඔවුන්ගේ කැමැත්ත/අකමැත්ත පිළිබඳ අධිකාරිය පිළිතුරු අපේක්ෂාවෙන් පසුවන අතර ඒ සඳහා ඔවුන්ගේ පිළිතුරු ලැබුණු පසු අන්තර්ග්‍රහණ ක්‍රියාවලිය | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශ පරිදි අන්තර්ග්‍රහණය කිරීමේ හෝ බඳවා ගැනීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | ඉදිරියට ගෙනයාමේ හැකියාව පවතින බව. | |
| (ඇ) අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය තුළ පවතින ඉහළ කළමනාකරණ තනතුරු 21 කින් තනතුරු 18 ක් හෙවත් සියයට 71 ක්ම පුරප්පාඩුවී පැවතුණු බැවින් අවශ්‍ය හා අවශ්‍ය නොවන තනතුරු හඳුනාගෙන අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට අපොහොසත්වී තිබුණු අතර අවශ්‍ය තනතුරු පුරප්පාඩුවී පැවතීම අධිකාරියේ සමස්ත කාර්යසාධනය කෙරෙහි බලපෑමක් ඇති විය හැකි බව නිරීක්ෂණය විය. | අධිකාරියට අනුමතව ඉහල කළමනාකරණ තනතුරු 21ක් පවතින අතර එම ඉහල කළමනාකරණ තනතුරු අතරින් අධ්‍යක්ෂ (මානව සම්පත්) තනතුර සඳහා බඳවා ගැනීම් සිදු කළ නමුත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව එම නිලධාරිණිය සේවයෙන් ඉවත් කරන ලද බව සහ නීති නිලධාරි තනතුර සඳහා ද බඳවා ගැනීම් සිදු කර තිබුණද, එම නිලධාරිනියද අධිකාරියේ සේවයෙන් ඉල්ලා අස් වූ බව. | මෙම පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) ඉකුත් වර්ෂය තුළ දී රු.308,487 ක් වැය කර පුවත්පත් දැන්වීම් පළ කර අධ්‍යක්ෂ (මානව සම්පත්) සහ අභ්‍යන්තර විගණක තනතුරු සඳහා අයැඳුම්පත් කැඳවා තිබුණු නමුත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් එම තනතුරු පුරප්පාඩුව පැවතුණි. | අධ්‍යක්ෂ (මානව සම්පත්) හා අභ්‍යන්තර විගණක යන තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වන ලද අතර සුදුසු අයදුම්කරුවන් නොසිටීම හේතුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම සම්මුඛ පරීක්ෂණ වල ලකුණු අවලංගු කිරීමට තීරණය කළ බව සහ අභ්‍යන්තර විගණක තනතුර සඳහා බඳවා ගැනීමට අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් අවසර ඉල්ලා ලිපියක් යොමුකර ඇති අතර අවසර ලැබීමෙන් පසු මෙම තනතුර සඳහා බඳවා ගැනීම් සිදු කිරීම සඳහා අපේක්ෂා කරන බව සහ අධ්‍යක්ෂ (මානව සම්පත්) තනතුර සඳහා වඩාත් සුදුසුකම් සහිත නිලධාරියකු බඳවා ගැනීමට හැකිවන පරිද්දෙන් බඳවාගැනීමේ පරිපාටි සංශෝධනයන් කිරීමේ ක්‍රියාවලිය අවසන් වූ පසු මෙම තනතුර සඳහා බඳවා ගැනීම් සිදුකිරීමට හැකි වන බව. | එම |
| (ඉ) ඖෂධ සහ ඔසුසල් නියාමන කටයුතු සඳහා ඖෂධ පරීක්ෂක තනතුරු 20 ක් අනුමත කරවා ගෙන තිබුණු නමුත් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් අධිකාරිය වෙත අනුයුක්ත කර තිබුණු ආහාර සහ ඖෂධ පරීක්ෂකවරු දෙදෙනෙකු පමණක් සේවයේ යොදවා තිබුණි. අධිකාරියේ ප්‍රධාන කාර්යයන් වන ඖෂධ සහ ඔසුසල් නියාමනයට අදාළ කාර්ය සාධනය කෙරෙහි මෙම කාර්ය මණ්ඩල ඌනතාවය සෘජුවම බලපෑ හැකි බව නිරීක්ෂණය විය. | ජාතික ඖෂධ නියාමන අධිකාරිය සඳහා ඖෂධ පරීක්ෂක තනතුරු 20 ක් අනුමත වී තිබුණද, එහි යම් සංශෝධනයක් විය යුතු බව හඳුනාගෙන තිබූ බැවින් බඳවා ගැනීමේ පරිපාටි සකස් නොකළ බව සහ ඒ අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ තාවකාලිකව අනුයුක්ත කරන ලද නිලධාරින් දෙදෙනෙකු පමණක් සේවයේ නිරත වන අතර, මෙය ප්‍රමාණවත් නොවන බව පවසමින් ද්වීතියන පදනම මත නිලධාරින් ලබා දෙන ලෙස ඉල්ලමින් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ලිපි නිකුත් කළද ඊට ප්‍රතිචාරයක් නොලැබුණු බව. | එම |

| | | |
|---|---|---|
| (ඊ) ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය, ජාතික ඖෂධ නියාමන අධිකාරිය වෙත පවරා ගෙන වසර 07 කට වැඩි කාලයක් ගත වී ඇතත් එයට අවශ්‍ය කාර්ය මණ්ඩලය මෙතෙක් අනුමත කරවා ගෙන නොතිබුණි. | ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයට අදාල තනතුරු කවරක්ද යන්න හා ඒවා සංශෝධනය විය යුතු ආකාරය මේ වන විට හඳුනාගෙන ඇති බව සහ ස්ථිර වශයෙන් තනතුරු පිහිටුවන තෙක් කොන්ත්‍රාත් පදනම මත ඖෂධ විශ්ලේෂක නිලධාරීන් 12ක් බඳවා ගැනීම සඳහා අනුමත කර ඇති අතර, එම බඳවා ගැනීම් සිදු කිරීම සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් අනුමැතිය ලැබුණු පසු එම බඳවාගැනීම් සිදුකළ හැකි බව. | ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන දින 24 ක ප්‍රමාදයක් සහිතව 2023 මාර්තු 24 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනයට ඉදිරිපත් නොවුණි. | ඉදිරි වර්ෂයේදී මෙවැනි ප්‍රමාදයකින් තොරව නිවැරදි කාල සීමාව තුල අවසන් ගිණුම් විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 4.2 වාර්ෂික වාර්තාව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ 23 වන වගන්තිය ප්‍රකාරව, මුදල් වර්ෂය අවසන්වී මාස හයක කාලයක් ඇතුළත අමාත්‍යවරයා වෙත අධිකාරිය විසින් එම මුදල් වර්ෂය ඇතුළත සිදුකරනු ලැබූ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාවට විගණකාධිපති වාර්තාව සමඟ අදාළ වර්ෂය සඳහා වූ අධිකාරියේ විගණනය කරන ලද ගිණුම් වාර්තාව සහ එළඹෙන වර්ෂය සඳහා වූ යෝජිත කටයුතු පිළිබඳ වාර්තාවක්ද අමුණා තැබිය යුතුය. එම වාර්තාව ලද දින සිට මාස හයක කාලයක් ඇතුළත අමාත්‍යවරයා විසින් එය පාර්ලිමේන්තුව | 2017, 2018, 2019 හා 2020 වර්ෂ සඳහා වාර්ෂික වාර්තා මේ වන විට අධිකාරිය විසින් පාර්ලිමේන්තුව දක්වා ඉදිරිපත් කර ඇති අතර 2021 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව මෙම සතිය තුලදී සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇති බව සහ 2022 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව මේ වන විට සකස් කරමින් පවතින බව. | 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව පිළියෙල කර කඩිනමින් අමාත්‍යවරයා වෙත හා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු වුවද, 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව පිළියෙල කර අමාත්‍යවරයා වෙත හා පාර්ලිමේන්තුව වෙත මෙතෙක් ඉදිරිපත් කර නොතිබුණි.

## 4.3 උපායමාර්ගික සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.3 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය ආරම්භයට දින 15 කට පෙර උපායමාර්ගික සැලැස්ම පිළියෙළ කර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හරහා භාණ්ඩාගාර ලේකම්ට සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අධිකාරිය විසින් එපරිදි කටයුතු කර නොතිබුණු අතර උපායමාර්ගික සැලැස්ම වෙනුවට 2022-2026 වර්ෂ සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙළ කර තිබුණි. එම සංයුක්ත සැලැස්මක් මඟින් උපායමාර්ගික සැලැස්ම තුළ ඇතුළත් විය යුතු අධිකාරියේ අරමුණු සහ වර්තමාන තත්ත්වය අතර කාර්යක්ෂමතා පරතරය සහ සංවර්ධන පරතරය හඳුනාගෙන නොතිබුණු අතර එම පරතරය පියවීම සඳහා අවශ්‍ය උපාය මාර්ග ද සැලසුම් කර නොතිබුණි. | මේ වන විට මෙම කටයුතු විධිමත් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 4.4 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්රලේඛයේ 2.3 ඡේදය ප්‍රකාරව අධිකාරිය විසින් පිළියෙළ කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම තුළ එක් එක් ක්‍රියාකාරකම් සඳහා නිශ්චිත කාල ඉලක්කයන් දක්වා නොතිබුණි. | මේ වන විට මෙම කටයුතු විධිමත් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 4.5 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය සහ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.4 ඡේදය ප්‍රකාරව අධිකාරිය | අභ්‍යන්තර විගණක තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වුව ද සුදුසු අයදුම්කරුවකු නොසිටීම හේතුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම සම්මුඛ | විගණන පනත සහ අදාළ චක්‍රලේඛ විධිවිධාන |

| | | |
|---|---|---|
| වෙනුවෙන් අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබුණු අතර අධිකාරියේ කටයුතු සම්බන්ධයෙන් සෘජුවම පාලක මණ්ඩලය වෙත වාර්තා කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරයකු පත් කර නොතිබුණි. | පරීක්ෂණ වල ලකුණු අවලංගු කළ අතර බඳවා ගැනීම සඳහා අවසර ඉල්ලා අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත යොමු කළ ලිපියට අවසර ලැබීමෙන් පසු මෙම තනතුර සඳහා බඳවා ගැනීමට අපේක්ෂා කරන බව. | ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**4.6** **අයවැය පාලනය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.3 ඡේදය ප්‍රකාරව පිළියෙළ කර තිබුණු වාර්ෂික අයවැය සහ පුරෝකථන මූල්‍ය ප්‍රකාශන තුළ අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබුණි. | මේ වන විට මෙම කටයුතු විධිමත් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |